ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන

අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007

**ESP 1111 - අන්තර්කරණ අධ්‍යාපනය**

**කාලය පැය තුනයි.**

---

දිනය - 2007.12.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටත් දෙවන වන කොටසින් කැමති ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. ඌණතාවය යන සංකල්පය නිදසුන් යොදාගෙන පැහැදිළි කරන්න.

02. මන්ද මානසික ළමුන්ගේ බුද්ධි ඵලය මත පදනම් වූ වර්ගීකරණයට අයත් කොටස් 4 දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

03. දෘෂ්ටි ගැටළු සහිත දරුවෙකු පෙන්වන චර්යාමය ලක්ෂණ පහක් (5) ක් දක්වන්න.

04. දෘෂ්ටි විතානය සකස්ව ඇති ප්‍රධාන සෛල වර්ග දෙක නම් කොට ඉන් එකක කාර්යය පැහැදිලි කරන්න.

05. සන්නයන ශ්‍රවණ ඌණතාව හා සංවේදක ස්නායු ශ්‍රවන ඌණතාව අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

06. ඩිස්ග්‍රැෆියාව (dysgraphia) සහිත දරුවෙකු හඳුනාගත හැකි ලක්ෂණ 5 ක් දක්වන්න.

07. අපස්මාරය ඇතිවීමට හේතුවිය හැකි කරුණු 5 ක් ඉදිරිපත් කරන්න.

08. ළමයකුගේ අධ්‍යාපනයට බලපාන පාරිසරික සාධක තුනක් නම් කොට ඉන් එකක් පැහැදිළි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

**II - කොටස**

09. I. විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා විශේෂ පාසල්වල ලබාදෙන අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. "විශේෂ පාසල්වලට වඩා අන්තර්කරණ පන්ති කාමරයක ඉගෙනීම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුවාට වාසි සහගත වේ."
මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

10. I. මන්ද මානසිකත්වයට අයත් සහලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 04)

II. ඩවුන්ස් සින්ඩ්‍රෝමය සහිත දරුවන් පෙන්වන ශාරීරික ලක්ෂණ මොනවාද ? (ලකුණු 06)

III. ඩවුන්ස් සින්ඩ්‍රෝමය සහිත සිසුන්ගේ හැකියා වර්ධනයට ගුරුවරයෙකු විසින් උදව් කළ හැකි වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 10)

11. I. වර්තන දෝෂ යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. උත්තල හා අවතල කාච භාවිතයෙන් වර්තන දෝෂ නිවැරදි කළ හැක්කේ කෙසේදැයි රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

III. සිසුවෙකුට දෘෂ්ටි ගැටළුවක් තිබීම අධ්‍යාපනයට සෘණාත්මකව බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

12. I. කථන උත්පාදන ක්‍රියාවලිය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. ඇසෙන වචනයක් හා ලිඛිත වචනයක් කථනය මගින් ඉදිරිපත් කිරීමේදී මොළය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

III. පුද්ගලයෙකුට ශ්‍රවන ගැටළුවක් තිබීම ඔහුගේ භාෂා සංවර්ධනයට කෙසේ බලපෑම් ඇති කරයි ද? (ලකුණු 08)

13. I. පන්ති කාමරය තුළ සුහග සිසුන් හඳුනාගැනීමේ වැදගත්කම පැහැදිළි කරන්න.

(ලකුණු 08)

II. සුහග සහ සහජ දක්ෂතා ඇති සිසුන්ගේ විභව්‍යතා උපරිම කිරීමට ගුරුවරයා ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිළි කරන්න.

(ලකුණු 12)

14. පහත සිද්ධිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කමල් 8 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඔහු අනවධානයෙන් යුක්ත හා සෙමින් ඉගෙන ගන්නා ළමයෙකු ලෙස ප්‍රසිද්ධය. වාචිකව ලබාදෙන නිවේදන උපදෙස් කෙරෙහි සැලකිල්ලක් නොදක්වන අතර ඒ නිසා බොහෝවිට ඔහු ගුරුවරුන්ගේ දඬුවමට ලක් වේ. එමෙන්ම ඔහුගේ භාෂා සංවර්ධනය ද පහළ මට්ටමක් පෙන්නුම් කරයි.

දිනක් කමල් විදුහල්පතිතුමා පසුකොට පන්ති කාමරය බලා ගමන් ගන්නා විට විදුහල්පතිතුමා ඔහුව ඇමතීය. නමුත් කමල් ඒ පිළිබඳව සැලකිලිමත් නොවීම නිසා කෝපයට පත් විදුහල්පතිතුමා ළමුන් බොහෝ පිරිසක් ඉදිරියේ ඔහුට දඬුවම් කරන ලදී. එදා සිට කමල් පාසල් යාම ප්‍රතික්ෂේප කර ඇත.

I. කමල් තුළ කුමන ආකාරයේ ගැටළුවක් ඇත්තේ යැයි අනුමාන කරන්නේ ද?

(ලකුණු 04)

II. මෙවැනි ගැටළු නිසා පන්ති කාමරය තුළ ඔහු වැනි සිසුන් මුහුණපාන දුෂ්කරතා මොනවා ද?

(ලකුණු 08)

III. ගුරුවරයෙකු ලෙස මෙවන් ගැටළු ඇති සිසුන් කෙරෙහි ඔබ මැදිහත් වන්නේ කෙසේ ද?

(ලකුණු 08)

- හිමිකම් ඇවිරිණි. -